[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 6 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | පත්‍රය I/II | පැය - 2 යි. |
| --- | --- | --- | --- |

නම ..............................................................................................

**සැලකිය යුතුයි;**

- **ප්‍රශ්න අංක 1 සිට 20 දක්වා සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **ලැබෙන මුළු ලකුණු සංඛ්‍යාව 40කි.**

## i පත්‍රය

- **අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න.**

1) පංච මහා විලෝකනය හඳුන්වන තවත් නමකි,
   i. පංච සීලය. ii. පස්මහ බැලුම්. iii. පංචතූර්ය භාණ්ඩ iv. පංච නීවරණ

2) "අග්ගෝ හමස්මි ලෝකස්ස..." යන ගාථාව,
   i. සිදුහත් කුමරු විසින් පවසන ලදී.
   ii. බුදුරජාණන් වහන්සේ විසින් පවසන ලදී.
   iii. බෝධි සත්වයන් වහන්සේ විසින් පවසන ලදී.
   iv. කිසා ගෝතමිය විසින් පවසන ලදී.

3) වප් මගුල් දින සිදුහත් කුමරු විසින් වඩන ලද භාවනාව නම්,
   i. බුදු ගුණ භාවනාව යි.
   ii. සක්මන් භාවනාව යි.
   iii. මෛත්‍රී භාවනාව යි.
   iv. ආනාපාන සති භාවනාව යි.

4) සිදුහත් කුමරු ඒකාන්තයෙන්ම බුදුවන බව පවසන ලද්දේ කවුරුන් විසින්ද?
   i. සුද්ධෝදන රජතුමා විසිනි.
   ii. සර්වමිත්‍ර බමුණු පඬිතුමා විසිනි.
   iii. කොණ්ඩඤ්ඤ බමුණා විසිනි.
   iv. බමුණන් 108 දෙනකු විසිනි.

5) නිබ්බුත පද පවසන ලද්දේ,
   i. පටාචාරාව විසිනි.
   ii. කිසා ගෝතමිය විසිනි.
   iii. මහා ප්‍රජාපතී ගෝතමිය විසිනි.
   iv. චිංචි මානවිකාව විසිනි.

- **අංක 6 සිට 10 දක්වා ප්‍රශ්න වල හිස්තැනට ගැලපෙන පිළිතුර වරහන තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

6) සිදුහත් කුමරු ගිහිගෙය කළකිරුණේ ........................................................................................ දැකීමෙනි.
(සතර සංග්‍රහ වස්තු/ සතර පෙර නිමිති/ සතර ඍද්ධිපාද)

7) සිදුහත් කුමරු ගිහිගෙයින් නික්ම යාම සඳහා වූ විශේෂ නාමය .......................................................ලෙස හඳුන්වයි.
(මහාභිනිෂ්ක්‍රමණය/ සත්‍ය ගවේෂණය/දුෂ්කර ක්‍රියාව)

8) කොණ්ඩඤ්ඤ, වප්ප, භද්දිය, මහානාම, අස්සජි යන තාපසවරුන්ව හඳුන්වන ලද්දේ.............................. ...................................ලෙසිනි.
(භද්දවග්ගිය කුමාරවරුන්/ පස් වග තවුසන් / තුන්බෑ ජටිල පිරිස)

9) සිදුහත් බෝසතාණන් වහන්සේට කිරිපිඬු පූජා කරන්න ලද්දේ.................................................... විසිනි.
(සුජාතා සිටු කුමරිය /මහා ප්‍රජාපතී ගෝතමිය / විශාකා සිටු කුමරිය)

10) සිදුහත් බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත්වන විට වයස අවුරුදු ............................................කි.
(30 / 33 / 35 )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල "අ"කොටසට ගැලපෙන අංකය තෝරා "ආ" කොටසෙහි ඇති තිත් ඉර මත ලියන්න.**

| <u>"අ"කොටස</u> | <u>"ආ"කොටස</u> |
|---|---|
| 11) ඉතිපිසෝ භගවා අරහං යනු | (.........) 1. මෛත්‍රිය භාවනාව වඩන ආකාරය යි. |
| 12) මම නිදුක් වෙම්වා! නිරෝගි වෙම්වා...! | (.........) 2. කම්මැලි නැති බවයි. |
| 13) මේ වැලි දෝතේ වැලිකැට ගණනට මට ආශීර්වාද ලැබේවා... | (.........) 3. බුදුගුණ පාඨයයි. |
| 14) අලීනතාවය යනු | (.........) 4. සීලයයි. |
| 15) කය, වචනය සංවර කර ගැනීම. | (.........) 5. රාහුල හිමිගේ ප්‍රකාශයකි. |

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට අදාළ ප්‍රකාශ කියවා බලා හරි නම් හරි ( √ ) ලකුණ ද, වැරදි නම් වැරදි (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

16) අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි යනු බොරු කීමෙන් වැළකීමේ ශික්ෂා පදයයි. (     )
17) මෙත්තා,කරුණා, මුදිතා, උපේක්ඛා යනු සිව් බඹ විහරණය. (     )
18) මඝ කුමාරයා ඇතුළු පිරිසට ඇතා ළං නොවූයේ ඔවුන් ළඟ මන්ත්‍රයක් තිබූ නිසාවෙනි. (     )
19) ජාතික ගීයේ නිර්මාතෘවරයා වන්නේ ආනන්ද සමරකෝන් මහතා ය. (     )
20) ආනන්ද සර්පයා දුටුවාද? මෙම ප්‍රකාශය කරන ලද්දේ බුදුරජාණන් වහන්සේ විසිනි. (     )

**6 ශ්‍රේණිය** **බුද්ධ ධර්මය - ii පත්‍රය**

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20කි. අනෙක් ප්‍රශ්නවල එක ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් iiපත්‍රය සඳහා ලැබෙන මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 60කි .**

---

(1) දෙවන වාරය සඳහා ඔබ වෙත ලැබුණු ඇගයීම වූ භූමිකා රංගනය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. භූමිකා රංගනය සඳහා ඔබට ලැබුණු චරිතය කුමක්ද?
ii. භූමිකා රංගනය තුළ ඔබ ප්‍රිය කළ චරිත දෙකක් නම් කරන්න?
iii. ඔබට අදාල චරිතය රංගනය සඳහා ඔබට අවශ්‍ය වූ ද්‍රව්‍ය වර්ග දෙකක් නම් කරන්න.
iv. ඔබගේ චරිතය රංගනය සඳහා සූදානම් වීමේ දී ඔබ උපදෙස් ලබා ගත් දෙදෙනෙකු නම් කරන්න.
v. ඔබගේ චරිතය රංගනයට යාමේදී ඔබට මුහුණ දීමට සිදු වූ ගැටලු දෙකක් නම් කරන්න.
vi. මස කුමරු ඇතුළු පිරිස ආරක්ෂා කළ ප්‍රතිපත්තිවලට කියන නම කුමක්ද?
vii. මස කුමරු ඇතුළු පිරිස ඉදිකළ ස්ථාන දෙකක් නම් කරන්න
viii. මස කුමරු තුළ තිබූ හොඳ ගතිගුණ දෙකක් සඳහන් කරන්න.
ix. මස කුමරුට එල්ල වූ අභියෝග ඔහු ජය ගත්තේ කෙසේදැයි වාක්‍ය දෙකකින් සඳහන් කරන්න.
x. මස කුමරුගේ චරිතයෙන් ඔබගේ චරිතයට එකතු කරගත හැකි ආදර්ශ දෙකක් සඳහන් කරන්න.

**(ලකුණු 2 x 10 =20)**

(2) i. අත්ථස්සද්වාර ජාතක කතාව උපුටාගෙන ඇත්තේ කුමන කෘතියකින් ද? **(ලකුණු 2)**
ii. එම ජාතක කතාවට අදාල දියුණු වීමේ දොරටු තුනක් සඳහන් කරන්න. **(ලකුණු 3)**
iii. ඔබගේ දියුණුව ඔබටම ළඟා කරගැනීමට හැකිවන ආකාරය ගැන වාක්‍ය පහක් ලියා දක්වන්න **(ලකුණු 5)**

(3) i. අංග 8කින් යුතු ආර්ය මාර්ගය හඳුන්වන තවත් නමක් ලියන්න.
ii. ආර්ය මාර්ගයේ සීල ශික්ෂාවට අයත් අංග තුනක් සඳහන් කරන්න.
iii. "හොඳ වචන කතා කරමු" යන මාතෘකාව යටතේ වාක්‍ය පහක් ගොඩ නගන්න.

(4) i. සිගාල කුමරු අමතා බුදුරජාණන් වහන්සේ දේශනා කළ සූත්‍රය කුමක් ද?
ii. දරුවන් විසින් දෙමාපියන්ට ඉටු කළ යුතු යුතුකම් තුනක් සඳහන් කරන්න.
iii. දෙමාපියන් විසින් දරුවන්ට සලකන ආකාරය ගැන වාක්‍ය පහක් ලියා දක්වන්න.

(5) i. ගිහි පක්ෂය විසින් නිරන්තර රක්නා සීලය කුමක් ද?
ii. ත්‍රිකෝටික පාරිශුද්ධි ශීලයට අයත් අංග තුන නම් කරන්න.
iii. පන්සිල් රැකීමෙන් අපේ සමාජය යහපත් වන ආකාරය පිළිබඳ වාක්‍ය පහක් ලියන්න.

(6) i. ලංකාවේ ජාතික පුෂ්පය හා ජාතික වෘක්ෂය නම් කරන්න.
ii. ජාතික කොඩියේ ඇතුළත් සංකේතවලින් තුනක් නම් කරන්න.
iii. "ජාතික කොඩිය" භාවිතයේ දී ඔබ විසින් සැලකිලිමත් වියයුතු කරුණු පහක් ලියන්න.

(7) i. "නතං කම්මං කතං සාධු..." යන ධම්මපද ගාථාවේ ඉතිරි පද ලියා දක්වන්න.
ii. එම ගාථාවේ තේරුම ලියන්න.
iii. ඔබ විසින් කරන ලද හොඳ ක්‍රියා ඇතුළත් කරමින් වාක්‍ය පහක් ගොඩ නගන්න.

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]



දෙවන වාර ඇගයීම - 2023

6 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | පත්‍රය I/II

පිළිතුරු පත්‍ර

## පිළිතුරු පත්‍රය - I

- **ප්‍රශ්න අංක 1 සිට 20 දක්වා සියලුම ප්‍රශ්නවලට ලැබෙන මුළු ලකුණු සංඛ්‍යාව 40කි.**

| | | | |
|---|---|---|---|
| (1) - ii | (6) - සතර පෙර පෙරනිමිති. | (11) - 3 | (16) - × |
| (2) - i | (7) - මහාභිනිෂ්ක්‍රමණය. | (12) - 1 | (17) - √ |
| (3) - iv | (8) - පස් වග තවුසන්. | (13) - 5 | (18) - × |
| (4) - iii | (9) - සුජාතාසිටු කුමරිය. | (14) - 2 | (19) - √ |
| (5) - ii | (10) - 35කි. | (15) - 4 | (20) - √ |

**(ලකුණු 2 x 20 = 40)**

## පිළිතුරු පත්‍රය - II

(1) **ප්‍රශ්න අංක i සිට x දක්වා එක ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් ලබාදිය යුතු මුළු ලකුණු සංඛ්‍යාව 20කි.**

i. බුද්ධ ධර්මය 6 ශ්‍රේණිය 11 පාඩමට අනුව පිළිතුර සකස් කර තිබිය යුතුය.
ii. ලියා ඇති පිළිතුරට අනුව ලකුණු ලබා දෙන්න.
iii. ඇඳුම්, බ්‍රිස්ටල් බෝඩ්, මාකර් පෙන්, ආදේශ භාණ්ඩ ආදී...ද්‍රව්‍ය වර්ග දෙකක් සඳහන් කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.
iv. ගුරුතුමාගෙන්, දෙමාපියන්ගෙන්, යහළුවන්ගෙන්, වැඩිහිටියන්ගෙන්.
v. ඇඳුම් සොයා ගැනීමට නොහැකිවීම,තොරතුරු රැස්කර ගැනීමට බාධාවීම,පුවත්පත් හිඟබව, දෙබස් කට පාඩම් කර ගැනීමට නොහැකි වීම, දෙබස් ලිවීමට හැකියාව නැතිවීම.
vi. පන්සිල්.
vii. මහාමාර්ග ප්‍රතිසංස්කරණය, ඒ දඬු පාලම් තැනීම,වැව් පොකුණ ඉදිකිරීම,අම්බලන්තැනීම.
viii. ප්‍රියමනාප බව, වගකීම් සහිත බව, නිවැරදි ක්‍රියා ඇති බව, නායකත්ව ලක්ෂණ, මාපියන් පෝෂණය කිරීම,කුල දෙටුවන් පිදීම,ඇත්ත කතා කිරීම,මෘදු වචන කතා කිරීම,කේලාම් නොකීම,මසුරු නොවීම,මෛත්‍රිය කිරීම.
ix. වාක්‍ය ලියා ඇති ආකාරය ගැළපේ නම් ලකුණු දෙකක් ලබා දෙන්න.
x. සාරගර්භ පිළිතුරකට ලකුණු දෙකක් පිරි නමන්න. **(ලකුණු 2 x10 = 20)**

- **ප්‍රශ්න අංක 2 සිට 7 දක්වා ප්‍රශ්නවල, එක කොටසට ලකුණු 2ක් ද, දෙක කොටසට ලකුණු 3ක් ද, තුන්වන කොටසට ලකුණු 5ක්ද වන ආකාරයට මුළු ලකුණු 10ක් වන පරිදි ලබා දෙන්න.**

(2) i. පන්සිය පනස් ජාතක පොතෙනි. **(ලකුණු 2)**

ii. <u>දියුණු වීමේ දොරටු</u>

1. නිරෝගී බව. 2. සිල්වත් බව. 3. වැඩි හිටියන් ගේ උපදෙස් ලැබීම.
4.හොඳ ඉගෙනීමක් තිබීම. 5. දැහැමිව ජීවත් වීම,කම්මැලි නොවීම. **(ලකුණු 3)**

iii. පිළිතුර ලියා ඇති ආකාරය සලකා බලා අදාළ ලකුණු ලබා දෙන්න. **(ලකුණු 5)**

(3) i. ආර්ය අෂ්ටාංගික මාර්ගය / මැදුම් පිළිවෙත /මධ්‍යම ප්‍රතිපදාව. (ලකුණු 2)

ii. සම්මාවාචා,සම්මා කම්මන්ත,සම්මා ආජීව. (ලකුණු **3**)

iii. පිළිතුර ලියා ඇති ආකාරය දෙස බලා ලකුණු ලබා දෙන්න. (ලකුණු **5**)

(4) i. සිගාලෝවාද සූත්‍රයයි. (ලකුණු 2)

ii. 1. ආහාරපාන සපයා දීම.
2. අවශ්‍යතා ඉටුකර දීම.
3. පරම්පරාව රැක ගැනීම.
4. පරපුරෙන් පැවරී ඇති දේපළ ආරක්ෂා කිරීම.
5. දෙමාපියන් මිය ගිය පසු පිංකම් කොට පිං අනුමෝදන් කිරීම. (ලකුණු **3**)

iii. පිළිතුර ලියා ඇති ආකාරය දෙස බලා ලකුණු ලබා දෙන්න. (ලකුණු **5**)

(5) i. පංචශීලයයි. (ලකුණු 2)

ii. තමා වරදින් වැළකීම,අන් අයලවා වැරදි නොකර වීම,අන් අය කරන වැරදි අනුමත නොකිරීම. (ලකුණු **3**)

iii. පිළිතුර සාරවත්ව ලියා ඇත්නම් මුළු ලකුණු ලබා දෙන්න. (ලකුණු **5**)

(6) i. නිල් මහනෙල් මල, නා ගස (ලකුණු 2)

ii. කහපාට සිංහයා, අසිපත, බෝපත් හතර, තද රතුපාට, කහ තීරුව. (ලකුණු **3**)

iii. * ජාතික කොඩිය රැගෙන යාමේදී එහි යෂ්ටිය ඍජුව තබා ගැනීම.
* ක්‍රීඩා උත්සවවලදී හෝ වෙනත් අවස්ථාවල දී හුදු විනෝදය උදෙසා ජාතික කොඩිය පරිහරණය නොකිරීම.
* කිසිදු අවස්ථාවක එය බිම නොතැබීම.
* ජාතික කොඩිය ඔසවන අවස්ථාවලදී සියලු දෙනාම නැගී සිට සීරුවෙන් සිටීම.
* සිංහ රූපයේ පාද පහලට සිටින සේ කොඩිය එසවීම.
* ජාතික කොඩි එස වූ විගස ජාතික ගීය ගායනා කිරීම.
* හානියට පත් වූ හෝ අවලක්ෂණ වූ කොඩියක් නොඑසවීම. (ලකුණු **5**)

(7) i. " න තං කම්මං කතං සාධු - යං කත්වා අනුතප්පති
යස්ස අස්සුමුඛෝ රෝදං - විපාකං පටිසේවති " (ලකුණු 2)

ii. යම් ක්‍රියාවක් නිසා පසුතැවිල්ල ඇතිවේ ද? කඳුළු පිරි දෑසින් යුතුව හඬමින් විපාක විඳීමට සිදු වේද? එවැනි ක්‍රියා නොකිරීම හොඳයි. අමිහිරි අසතුටු දායක දුක්ඛ දායක ප්‍රතිඵල ලැබෙන ක්‍රියා නරක බව මෙම ගාථාවේ අදහසයි. (ලකුණු **3**)

iii. පිළිතුර ප්‍රමාණවත් වේ නම් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න. (ලකුණු **5**)

(ලකුණු **2 + 3 + 5 = 10**)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න